# මහජන පුස්තකාල හා එහි සේවා පිළිබඳ හැඳින්වීමක්

එම්.ජී.එච්.කේ විජේරත්න

## 1. හැඳින්වීම

"A collection of books and similar material organized and administered for reading consultation and study" යනුවෙන් ALA පාරිභාෂික ශබ්ද මාලාවෙහි පුස්තකාලය යන්න හඳුන්වා දී තිබේ. Library යන්න ලතින් බසින් ඉංග්‍රීසියට පැමිණුනු බවට මතයක් ද තිබේ. ලතින් බසින් library යනු පොත් යන්නයි. පොත් තැන්පත් කර ඇති ගෘහය පුස්තකාලය යනුවෙන් සිංහල ශබ්ද කෝෂයෙහි අර්ථ දක්වා ඇත. "ස්වයං අධ්‍යාපනය සඳහා තිබෙන ක්ෂේම භූමිය පුස්තකාලයයි" යනුවෙන් එස්. ආර්. රංගනාදන් පුස්තකාලය අර්ථ දක්වා තිබේ. එසේම ජේ. එච්. ෂේරාගේ මතයට අනුව "පුස්තකාලය සියල්ලන්ට අවබෝධය දියුණුව හා ප්‍රීතිය ගෙන එන විශ්ව අධ්‍යාපනයේ අතවැසියා වේ."

නූතන පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයට අනුව පුස්තකාලය වර්ග කිහිපයකි. එනම්,

1. මහජන පුස්තකාලය
2. අධ්‍යාපන පුස්තකාලය
3. විශේෂ පුස්තකාලය
4. ජාතික පුස්තකාලය
5. ප්‍රලේඛන මධ්‍යස්ථාන/ තොරතුරු මධ්‍යස්ථාන
6. අතථ්‍ය පුස්තකාල වශයෙනි.

ඉහතින් දක්වන ලද සෑම පුසතකාලයකම අරමුණුවල සම්පිණ්ඩනය පහත අයුරින් දැක්විය හැකිය.

1. අධ්‍යාපනික අරමුණු
2. විනෝදාත්මක අරමුණු
3. පර්යේෂණ අරමුණු
4. තොරතුරු සහ සංරක්ෂණ අරමුණු යනුවෙනි.

**2. මහජන පුස්තකාලය**

වර්තමාන පුස්තකාල ක්ෂේත්‍රයේ ජනප්‍රියතම පුස්තකාල වර්ගය ලෙස මහජන පුස්තකාලය හඳුන්වා දිය හැකිය. සිඟිත්තාගේ පටන් මහල්ලා දක්වා සෑම පුද්ගලයෙකුටම කිසිදු වර්ග භේදයකින් තොරව එක ලෙස සේවය සැපයීම මහජන පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වේ. යුනෙස්කෝ සංවිධානයේ නිර්වචනය අනුව "මහජන පුස්තකාලය ජීවමාන අධ්‍යාපනික සංස්කෘතික හා සන්නිවේදන මාධ්‍යයක් වන අතර ජනතාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය වැටහීම සාමය හා සුහදතාවය වර්ධනය කිරීමෙහි ලා උපයෝගී වන පොදු ආයතනයකි. එසේම ඊශ්වරී කොරයා පවසනුයේ "රටේ අධ්‍යාපන තොරතුරු අවශ්‍යතා සංස්කෘතික හා විනෝදාත්මක අවශ්‍යතා සපුරාලන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරන බැවින් මහජන පුස්තකාලය ජාතියට ඉමහත් සේවාවක් සපයන ආයතනයක්ය. මහජන පුස්තකාලය කෙනෙකුට වෙනත් අයෙකුගේ මැදිහත් වීමක් නොමැතිව නිදහසේ ඉගෙනගැනීමට අවස්ථාව සලසයි. ජාතියේ දියුණුව සඳහා සංස්කෘතිය හා අධ්‍යාපනය අවශ්‍ය වූවකි. මෙම අවශ්‍යතාවය බොහෝ දුරට මහජන පුස්තකාලය සපුරාලයි. යනුවෙනි. එසේම මහජන පුස්තකාලය අධ්‍යාපනය, සංස්කෘතිය හා සන්නිවේදනය පිළිබඳ ප්‍රජාතාන්ත්‍රීය ආයතනයකි. එසේම මිනිසාගේ සිතුම් පැතුම් හා නිර්මාණාත්මක කුසලතාවන් පිළිබිඹු කරන්නා වූ ලේඛන සම්භාරය නොමිලයේ නිදහසේ හා පොදුවේ පරිහරණයට හා භුක්තිවිඳීමට සලසන ප්‍රධාන මාර්ගය මහජන පුස්තකාලය යනුවෙන් තවදුරටත් පෙන්වා දිය හැකිය.

**2.1. මහජන පුස්තකාලයක කාර්ය භාරය**

ප්‍රජාතන්ත්‍රීය සමාජයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත් ජනතාවගේ දේශපාලනමය අවබෝධය වැඩිදියුණු කිරීම සඳහාත් සහ

විවේක කාලය ප්‍රයෝජනවත් හා නිර්මාණශීලී අයුරින් ගෙවීම සඳහාත් අනගි මෙහෙයක් මහජන පුස්තකාලයට ඉටු කළ හැකිය. මෙකී කාර්ය භාරය මහජන පුස්තකාලයක ප්‍රධානතම කාර්ය භාරය ලෙස නම් කළ හැකිය.

### 2.2. මහජන පුස්තකාලයක පාඨක ප්‍රජාව

වඩාත් පෘථුල පාඨක ප්‍රජාවක් මහජන පුස්තකාලය සතුව පවතී. කෙටියෙන් කිවහොත් තොරතුරු දැනගැනීමේ උවමනාව ඇති සහ තොරතුරු දැනගැනීමට හැකි සියලු දෙනාම එහි පාඨකයෝය. පාඨකයන්ගේ වයස් සීමාව අතින් බැලුවහොත් දෙමාපියන් කැටිව පුස්තකාලයට පැමිනිය හැකි කුඩා දරුවාගේ පටන් සැරයටියෙන් වුව පැමිණිය හැකි මහල්ලා දක්වා සියලු වයස් සීමාවන්ට අයත් වූවන් මහජන පුස්තකාලයේ පාඨකයන් හැටියට දැක්විය හැකිය. එසේම සාක්ෂරතාවෙන් හෙබි තැනැත්තාගේ පටන් පර්යේෂකයා දක්වාම පාඨක ප්‍රජාව මෙහිදී අදාළ වේ. තවද ශාඛා පුස්තකාල මගින්, ජංගම පුස්තකාල මගින් පොත් පෙට්ටි ලබා ගැනීම් ආදිය මගින් ද විවිධ වර්ගයේ පාඨකයෝ මහජන පුස්තකාලය හා සම්බන්ධ වෙති. එසේම රෝහල් පුස්තකාල සේවා, සිරකරු පුස්තකාල සේවා ආදිය ද මෙහි ලා සඳහන් කළ හැකිය. මේ අනුව බලන විට බාල, තරුණ, මහලු, උගත්, නූගත් ආදී වශයෙන් සෑම වර්ගයකම නියෝජිත පිරිස් මහජන පුස්තකාලයක පාඨක පිරිස් හැටියට පෙන්වා දිය හැකිය.

### 3. මහජන පුස්තකාල සේවා

මහජන පුස්තකාලවල විශිෂ්ට ලක්ෂණයක් වන්නේ ඒවායේ ඇති විශිෂ්ට පුස්තකාල සේවා පද්ධතියයි. ඒ අතර,

1. පුස්තකාල ද්‍රව්‍ය නිකුත් කිරීම
2. කියවීම් ශාලා පහසුකම් සැපයීම
3. පාඨක උපදේශන සේවා සැපයීම
4. තොරතුරු සේවා සැපයීම

5. ප්‍රජා දැන්වීම් සේවා
6. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය සේවා සැපයීම
7. අන්තර්පුස්තකාල පිරුළු සේවා සැපයීම
8. මහජන පුස්තකාල විස්තෘත සේවා යනාදිය ප්‍රමුඛත්වයෙහි ලා සැළකිය හැකිය.

### 3.1. පුස්තකාල ද්‍රව්‍ය නිකුත් කිරීම

සාම්ප්‍රදායික සෑම පුස්තකාලයකින්ම ඉටු විය යුතු පුස්තකාල ද්‍රව්‍ය නිකුත් කිරීමේ සේවාව මහජන පුස්තකාල සතු ප්‍රධාන සේවාවකි. ඒ අනුව පොත් පත්, විමර්ශන ග්‍රන්ථ, පුවත් පත්, වාරසඟරා ආදිය සැපයීම මෙම සේවාවේදී සිදු කරනු ලබයි. එය සියලු මහජන පුස්තකාලවල දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.

### 3.2. කියවීම් ශාලා පහසුකම් සැපයීම

මෙය පුස්තකාලයකින් සෘජුවම ඉටුකළ යුතු සේවාවක් නොවන නමුත් නිදහස් කියවීම් ශාලා පහසුකම් සැපයිම තවත් එක් විශේෂිත සේවාවක් හැටියට දැක්විය හැකිය. පාඨකයන්ගේ පෞද්ගලික සටහන් පොත් පත් ආදිය රැගෙනවිත් එය කියවීමට ඉඩකඩ ලබා දීම මෙම සේවාව යටතේ සිදු කරනු ලබයි. කාර්ය බහුල දිවිපෙවෙත් ගත කරනු ලබන බොහෝ රටවල්වල මෙම පහසුකම් සපයා ඇති අයුරු දැක ගත හැකිය. ඒ අතර Reading hall (කියවිම් ශාලා), conference hall (සම්මන්ත්‍රණ ශාලා) ප්‍රධානය.

### 3.3. පාඨක උපදේශන සේවා සැපයීම

පුස්තකාල පාඨකයන්ට පුස්තකාලය හා එහි සම්පත් භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා දීමත් සහ දෛනික තොරතුරු අවශ්‍යතාවලදී අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීමත් වැදගත් සේවාවක් සේ හැඳිනගත හැකිය. පාඨක පිරිස මහත් සේ විස්තෘත ප්‍රජාවක් වන හෙයින් ද පාඨක උපදෙස් සේවා වැදගත් වේ. එසේම කාලීන වශයෙන් පුද්ගලයා දැනුවත් විය යුතු සාමාන්‍ය පොදු කරුණු පිළිබඳව පාඨකයා දැනුවත් කිරීම ද මෙහි දී සිදු කරනු ලබයි.

### 3.4. තොරතුරු සේවා සැපයීම

නිවෙසක සැලැස්ම අනුමත කරවා ගැනීම, ලී ප්‍රවාහනය සඳහා අවසර ලබා ගැනීම, නිවසකට විදුලිය ලබා ගැනීම, ආදී විවිධ කරුණු පිළිබඳව ඇති වන ප්‍රශ්න සාකච්ඡා කොට විසඳා ගැනීම හෝ ඊට අදාල තොරතුරු ලබා ගැනීමට මග පෙන්වීම සඳහා හෝ විධිමත් වැඩපිළිවෙළක් අනුගමනය කරමින් විවිධ වූ අවශ්‍යතාවයන් සපුරාලමින් තොරතුරු සේවාවන් සම්පාදනය කිරීමට ද මහජන පුස්තකාලයට හැකිය.

### 3.5. ප්‍රජා දැන්වීම් සේවා

මහජන පුස්තකාලය මහජනතාව නිතර ගැවසෙන ස්ථානයක් වන බැවින් එහි ප්‍රජා දැන්වීම් සේවාවක් ද පවත්වාගෙන යා හැකිය. නිදසුනක් ලෙස පහත සඳහන් පාඨක ප්‍රජා දැන්වීම් දැක්විය හැකිය.

1. පාඨකයකු සතු භාණ්ඩ විකිණීමට ඇති බව දැන්වීම
2. දේපොළ අස්ථානගත වූවන්ගේ පණිවුඩ දැන්වීම
3. වෘත්තිමය අවශ්‍යතාවයන් ආදිය දැන්වීම යනාදී වශයෙනි.

### 3.6. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය සේවා සැපයීම

බොහෝ මහජන පුස්තකාලයන් හරහා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය එකතුවක් වෙනම පවත්වාගෙන යනු ලබයි. පාඨකයින්ගේ දැනුම වර්ධනය මෙන්ම නිර්මාණශීලි චින්තනය වර්ධනය, රසවින්දනාත්මක බව වර්ධනය කිරීම යනාදිය මෙවැනි සේවාවක් හරහා අපේක්ෂා කරනු ලැබේ.

### 3.7. අන්තර් පුස්තකාල පිරුළු සේවා

පොත් මිලට ගැනීමට ඇති මූල්‍යමය සම්පත්වල සීමිත භාවයත් අති සීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු මාධ්‍යවල පරිමාවත් හේතුවෙන් කිසිම පුස්තකාලයකට ස්වයංපෝෂිත තත්වයකට පැමිණිය නොහැකිය. මෙම තත්වය හමුවේ පාටක ඉල්ලීම් සපුරාලීමට

ඇති ඉතාම ඵලදායී මාර්ගය වී ඇත්තේ අන්තර් පුස්තකාල පිරුළු සේවාවයි. එමගින් සම්පත් හුවමාරු කරගැනීම පිළිබඳ එකඟතාවයට පත් පුස්තකාල පද්ධතියක එක පුස්තකාලයක සාමාජිකයකුගේ අවශ්‍යතාවන් වෙනත් පුස්තකාල වල සම්පත්වලින් තෘප්තිමත් කිරීම සිදුවේ. මෙහිදී බලපානු ලබන කාරණා කිහිපයකි.

1. පුස්තකාල අතර අන්තර් පුස්තකාල පිරුළු සේවාව ක්‍රියාත්මක කිරීමෙහි ලා සම්මුතියකට පැමිණ තිබීම.

2. අන්තර් පුස්තකාල පිරුළු සඳහා යැවෙන ද්‍රව්‍ය කවරේ ද යන්නත් ඒ හා සම්බන්ධ වියදම් හා ඊට අනුපූරක වගකීම් ආදිය පිළිබඳවත් එකඟතාවට පැමිණීම.

3. ඉහත කඩයිම් සපුරා ලූ පසු කුමන පුස්තකාලයක තමනට අවශ්‍ය ග්‍රන්ථ තිබේ දැයි දැනගැනීම.

චිත්‍ර ඡායාරූප නිර්මාණාත්මක කලා කෘති ආදී දෑ පිළිබඳ ප්‍රදර්ශන පැවැත්වීම ළමයින් සඳහා කථා පැය ආදී ව්‍යාප්ත සේවා මගින් පුස්තකාලයට ජනතාව ආකර්ශනය වන පරිදි කටයුතු කිරීම පුස්තකාලයේ දීර්ඝකාලීන පැවැත්මට වැදගත් කරුණකි. එසේම ජංගම පුස්තකාල ශාඛා පුස්තකාල හා පොත් පෙට්ටි සේවා ආදිය මගින් පුස්තකාල පොත පත මහජන පුස්තකාලයකට ඉටු කළ හැකි තවත් මෙහෙවරකි. මේ ආදි සේවාවන් ට අමතරව අවශ්‍ය මූලික සම්පත් ඇති මහජන පුස්තකාලවලට ඉන්ටර්නෙට් සේවා ක්‍රියාත්මක කිරීම මගින් වඩාත් පෘථුල තොරතුරු සේවාවක් ඉටු කිරීමට ද හැකියාව ලැබෙනු ඇත.

### 3.8. මහජන පුස්තකාල විස්තෘත සේවා

"පුස්තකාල සේවාව පිළිබඳව අවබෝධයක් නැති කථික සමිති, කියවීම් කව, සාකච්ඡා කණ්ඩායම් වැනි ජන කොටස්වලට සහාය වීම හා බන්ධනාගාර, ආරෝග්‍ය ශාලා, සාහිත්‍ය සංගම්, සමාජ ශාලා වැනි ආයතනවලට පොත් සැපයීම, යනුවෙන් එල්. එම්. හැරොඩ් විසින් පුස්තකාලාධිපත්වරුන්ගේ පාරිභාෂික ශබ්ද මාලාවෙහි දී ව්‍යාප්ති කටයුතු සේවා යන්න පිළිබඳ අර්ථ නිරුක්ති ඉදිරිපත් කොට තිබේ.

එසේම පුස්තකාල මගින් සපයනු ලබන සේවාවලින් ප්‍රයෝජන ලබා ගැනීම සඳහා පුස්තකාලවලට පැමිණිය නොහැකි රෝගී, වයස්ගත, අංග විකල, හා සිර කරුවන් වැනි අයට ද පුස්තකාල සේවාවන් ලබා ගත හැකි වන පරිදි එම සේවාවන් ව්‍යාප්ත කිරීම පුස්තකාල ව්‍යාප්ති සේවාවන් හෙවත් පුස්තකාල විස්තෘත සේවාවන් ලෙස දැක්විය හැකිය. "පුස්තකාල සේවාවන් සහ පොත් තොග පිළිබඳව අවධානය යොමු කරවීමේ අරමුණින් පුස්තකාලය තුළ හා ඉන් බැහැරව දේශනමාලා චිත්‍රපට දර්ශන පොත් ප්‍රදර්ශන සාකච්ඡා සභා ආදිය සංවිධානය කිරීම" යනුවෙන් පුස්තකාල විස්තෘත සේවාවන්වලට තවත් එක් සියුම් නිර්වචනයක් පවතී.

මහජන පුස්තකාල තුළ ව්‍යාප්ති සේවා කටයුතුවල කිසිදු සීමාවක් නොතිබිය යුතුය යන්න පිළිගැනීමකි. "මහජන පුස්තකාල වැඩිම දෙනෙකුට වඩාත් ප්‍රයෝජනවත් ලෙස සංවිධානය කිරීම" පුස්තකාල ව්‍යාප්ති සේවා හෙවත් පුස්තකාල විස්තෘත සේවා යනුවෙන් හැඳින්වේ. "මහජන පුස්තකාලවලින් සපයනු ලබන සේවයේ හා ඒවායේ පරිහරනය කළ හැකි සෑම අන්දමකින්ම හැකි තරම් දුරට වැඩි දියුණු කිරීම" මහජන පුස්තකාල විස්තෘත සේවා ලෙස වටහා ගත හැකිය. මහජන පුස්තකාල සංකල්පය ලොව පුරා පිළිගෙන තිබුණ ද ඒවායේ භූමිකාව සහ ප්‍රමුඛතාව හැම විටම එක හා සමාන වේ. මහජන පුස්තකාලයේ භූමිකාවන්

- අධ්‍යාපනය
- තොරතුරු
- පුද්ගල සංවර්ධනය යනුවෙන් ප්‍රධාන තොටස් තුනකට අනුව වර්ග කර දක්වා ඇත.

විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනයට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම මහජන පුස්තකාලයක මූලික වගකීමක් විය. මූලික සාක්ෂරතා මට්ටමේ සිට විශේෂඥ මට්ටම දක්වා අධ්‍යාපනය සඳහා වන ඉල්ලුම සහ අවශ්‍යතාව විශාල වශයෙන් වෙනසක් පෙන්නුම් නොකරයි. සමහර රටවල අධ්‍යාපන කර්තව්‍ය සඳහා මහජන පුස්තකාලවලින් සෘජු බලපෑමක් එල්ල වේ. එහෙත් ඊටම පමණක් සීමා නොවී ඉන්

එපිට ගිය විස්තෘත සේවාවක් සැපයීම මහජන පුස්තකාලයේ කාර්ය භාරය වේ.

ලෝකයේ අන් කවර කලෙකටත් වඩා තොරතුරු විශාල අගයක් අත්පත් කරගෙන තිබේ. නූතන ලෝකයේ තොරතුරු යනු බලයකි. එමෙන්ම වත්මනෙහි තොරතුරුවලට ප්‍රවේශ විය හැකි මාර්ගද බොහෝය. ඒ සඳහා ඇතැම් විට නිවසින් බැහැර වීම ද අනවශ්‍යය. එහෙයින් විශ්වාසදායී තොරතුරු ප්‍රතිග්‍රහණය වර්තමානයේ ඉතාමත් වැදගත් හා ඉහළ වටිනාකමක් ඇති කාර්යයක් බවට පත් වී තිබේ. එබැවින් තොරතුරු ක්ෂේත්‍රයේ වැදගත්ම භූමිකාවක් රඟ දැක්වීමට මහජන පුස්තකාල සමත්විය යුතු වී තිබේ.

පුද්ගල සංවර්ධනය සඳහා ද මහජන පුස්තකාලවලින් ලැබෙනුයේ මහඟු පිටිවහලකි.

- අධ්‍යයන අවශ්‍යතා
- අධ්‍යාපනික අවශ්‍යතා
- විනෝදාස්වාදනීය අවශ්‍යතා
- පර්යේෂණ අවශ්‍යතා

යනාදී වූ පුද්ගල සංවර්ධනයේ පුළුල් ක්ෂේත්‍ර ගණනාවකම මහජන පුස්තකාලය තම සේවාවන් හසුරුවනු ලබයි. සමහර රටවල මහජන පුස්තකාලවල ප්‍රමුඛතම කාර්ය ලෙස සලකනුයේ වින්දනය හා විවේකය උදෙසා පොත පත කියවීමට උපකාරී වීමය. මහජන පුස්තකාලයක සේවාවන් උගත් වැඩිහිටියන්ට හා පුස්තකාලයට පැමිණිය හැකි පාඨකයන්ට පමණක් නොව සියල්ලන් සඳහාය යන්න මූලික ප්‍රතිපත්තියකි. සේවාභිමුඛ විය යුතුය. විශාල සම්පත්වලින් අනූන මහජන පුස්තකාලයකට හැර වෙනත් කිසිදු මහජන පුස්තකාලයකට තමන්ගේ එකතුව පමණක් උපයෝගී කරගෙන පාඨකයා තෘප්තිමත් කිරීමට නොහැකිය. එහෙයින් තොරතුරු ජාල සහ සම්පත් බෙදා හදා ගැනීම පාඨක අවශ්‍යතා ඵලදායීව ඉටු කිරීමට මහජන පුස්තකාලවලට ගත හැකි තවත් එක් ක්‍රියාමාර්ගයකි.

### 3.8.1. පුස්තකාල විස්තෘත සේවාවන්ගේ අරමුණු

පුස්තකාලය වෙත පාඨකයා ඇද ගැනීමටත් ඔවුන්ට පුස්තකාලය පිළිබඳව කරුණු පහදා දීමටත් පුස්තකාල විස්තෘත සේවා භාවිතා කරනු ලබයි. එසේම පුස්තකාලයේ පාඨකයන් වන හා පාඨකයන් නොවන අයට එහි සේවාවන් ගැන හා සම්පත් ගැන මතක් කර දීමට ද ව්‍යාප්ති සේවා බෙහෙවින් ඉවහල් වේ. එසේම පුස්තකාලය මගින් සපයනු ලබන නොයෙක් සේවාවන් හා පහසුකම් ගැන දැන්වීම් පත්‍ර (Posters) ප්‍රචාරක සටහන් හා ප්‍රස්ථාර ආදිය මගින් පුස්තකාලයේ කාර්යයන් පිළිබඳව ද පාඨකයා දැනුවත් කිරීම ද මෙහිදී වෙසෙසින් දැක්විය හැකිය. පුස්තකාල සේවය මහජනයා අතර වඩාත් ජනප්‍රිය කිරීම සඳහා ප්‍රචාරක මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීමට විස්තෘත සේවාවන්ගේ එක් කාර්යයකි. ජනතාව අතර කියවීමේ පුරුද්ද ජනප්‍රිය කිරීමත් පාඨක රුචිය ඇති කිරීමත් පොත්පත් කියවීමෙහි ඇති උදාසීනත්වය නැති කිරීමත් යනාදී අරමුණු හැටියට දැක්විය හැකිය. විවිධ ප්‍රසංග, නාට්‍ය, නෘත්‍ය හා වෙනත් විනෝදාත්මක කටයුතු සඳහා විශේෂ ස්ථාන හා උපකරණ නොමැති පළාත් වල ඒ සඳහා සුදුසු ස්ථානයක් හැටියටද පුස්තකාලය භාවිත කිරීම කළ හැකිය. එයද විස්තෘත සේවාවන්ට අයත් එක්තරා සේවයකි.

### 3.8.2 විස්තෘත සේවාවන් කෙරෙහි බලපාන කරුණු

විස්තෘත සේවාවන් සැලසීමට ප්‍රථම ප්‍රමාණවත් පොත් තොග, කාර්යක්ෂම හා පුහුණු කාර්ය මණ්ඩල හා ඉඩකඩ ඇති ගොඩනැගිලිවලින් සමන්විත වූ යහපත් යහපත් පුස්තකාල සේවයක් තිබිය යුතුය. විස්තෘත සේවාවන් සපයන විට එම සේවාවන් සියලුම ජන කොටස් වලට පොදුවේ බලපාන සේ සකස් විය යුතුය. එම සේවා සියලු දෙනා උදෙසා විය යුතුය. එම නිසා වාද විවාද තරඟ, දැනුම මිනුම තරඟ, නාට්‍ය රඟ දැක්වීම් වැනි ව්‍යාප්ති සේවා කටයුතු සංවිධානය කිරීමේදී තනි පුද්ගලයන් වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් ඒවාට සහභාගී වීමේ අවස්ථාව සැලසීමේ දී සමාජයේ වෙසෙන සියලු දෙනාට ඒ සඳහා එක හා සමාන අවස්ථාවන් සලසා දිය යුතුය. දේශන මාලාවන්, සාකච්ඡා සභා, කථා පැය වැනි ව්‍යාප්ති සේවා කටයුතු ඉතා වටිනා හා විශිෂ්ට සමාජ සේවයක් ඉටු කිරීමට සමත් විස්තෘත සේවා ලෙස හැඳිනගත හැකිය.

### 3.8.3 ව්‍යාප්ති සේවාවන් සඳහා බලපාන මූලධර්ම

ව්‍යාප්ති සේවාවන්ට අදාළ ප්‍රතිපත්ති පැහැදිලිව සඳහන් කර තිබීම අවශ්‍යය. මේ අනුව පුස්තකාල බලමණ්ඩල නොහොත් පාලකයන් විසින් නිකුත් කරන ලද පැහැදිලි ප්‍රතිපත්ති අවශ්‍ය වන අතර සියලුම විස්තෘත සේවාවන් එම ප්‍රතිපත්ති මත රඳා පැවතිය යුතුය පුස්තකාලාධිපතිට හා ඔහුගේ පුස්තකාල කමිටුවට ව්‍යාප්ති සේවා වැඩපිළිවෙළවල් ක්‍රමවත්ව සකස් කර ක්‍රියාත්මක කළ හැකි වන පරිදි මෙම ප්‍රතිපත්ති පුළුල්ව දක්වා තිබීම වැදගත් වේ.

විස්තෘත සේවාවන් හැකි තරම් උසස් ලෙස හා ඉහළ මට්ටමකින් සැලසීම සඳහා ඒ පිළිබඳව ඉතා සැලකිලිමත්ව හා සුපරික්ෂාකාරීව සලකා බැලිය යුතුය. සෑම ආකාරයකම ක්‍රියා කටයුතු සමග පුස්තකාලය සම්බන්ධ වීම විස්තෘත සේවා කටයුතු වල මූලික ප්‍රතිපත්තියක් විය යුතුය.

## 4. නිගමනය

මහජන පුස්තකාලය හරහා කුඩා දරුවාගේ පටන් මහල්ලා දක්වා සියලු දෙනා වෙත සේවා ලබා දෙනු ලැබේ. ඒ අනුව පුළුල් පාඨක පිරිසකට විශාල සේවාවන් සමුදායක් ලබා දිමට මහජන පුස්තකාල නිරන්තරයෙන් කටයුතු කරනු ලැබේ. පුස්තකාල ද්‍රව්‍ය නිකුත් කිරීම, කියවීම් ශාලා පහසුකම් සැපයීම, පාඨක උපදේශන සේවා සැපයීම, තොරතුරු සේවා සැපයීම, ප්‍රජා දැන්වීම් සේවා, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය සේවා සැපයීම, අන්තර්පුස්තකාල පිරුලු සේවා සැපයීම, මහජන පුස්තකාල විස්තෘත සේවා යන සේවා ඒ අතර ප්‍රමුඛ වේ. එබැවින් මහජන පුස්තකාල අනෙකුත් පුස්තකාලවලින් වෙනස්වනුයේ එය මහජන සේවය මත කැපවුණු පුස්තකාල වර්ගයක් විම මතය.

## ආශ්‍රිත මූලාශ්‍රය

මුතුකුඩ. ජූඩ්, ජයසුන්දර මෛත්‍රී, *පුස්තකාල හා විඥාපන විද්‍යාව*, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

කුමාර, නිලන්ත. ප්‍රදිප්, *විද්‍යාත්මක පුස්තකාල සේවාවක්*, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

ජයතිස්ස. එල්. ඒ, *පුස්තකාල කළමණාකරණය*, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

පණ්ඩිතරත්න, කේ. එල්, ''මහජන පුස්තකාල ව්‍යාප්ති සේවා'' ලිපිය, *පුස්තකාල ප්‍රවෘත්ති, 03 වන කලාපය*, අංක 3-4, 1982- ජූලි- දෙසැම්බර්